**අත්තනගල්ල ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| | **නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 දක්වා කරුණු ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළයුතු වුවත්, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.73,575,165 ක් වූ එකතු කිරීම් සහ රු.2,538,620 ක් වූ අඩු කිරීම් සිදු කර නොතිබීමත්, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.2,024,121 ක් වූ එකතු කිරීම් සිදු කර නොතිබීමත්, රු.44,595,096 ක් අඩුවෙන් අඩුකිරීමත් සහ රු.98,396 ක් වැඩියෙන් එකතුකිරීමත් සිදුකර තිබුණු අතර, මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.17,605,093 ක් වැඩියෙන් එකතු කර තිබීමත් රු.48,733 ක් අඩු කර නොතිබීමත් සිදුකර තිබුණි. | පිළිගන්නා බව. | ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වගන්තිය | උප කාර්යාල 2 ක වසර 14 ක් පැරණි තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබුණි. | වරිපනම් උධෘත තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව. | තක්සේරුව කරවාගෙන නව රේට අනුව වරිපනම් අයකළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(i) දරන පළාත් පාලන දෙපාර්තමේන්තු (බස්නාහිර පළාත) චක්‍රලේඛය | 2009 සහ 2014 වර්ෂවල තක්සේරු පදනම් කරගෙන කඩ කාමර 15 ක් කුලී අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්තා කැඳවා ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.72,539,698 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.59,614,955 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 34,589,000 | 35,475,188 | 32,386,415 | 26,783,373 | 32,702,400 | 34,204,457 | 32,884,417 | 30,661,387 |
| (ii) | කුලී | 40,420,000 | 31,809,558 | 34,438,424 | 31,594,480 | 12,432,745 | 39,188,773 | 31,229,555 | 38,381,665 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,654,000 | 1,916,870 | 1,916,870 | - | 1,583,000 | 1,597,976 | 1,597,976 | - |
| (iv) | වෙනත් ආදායම් | 348,515,000 | 371,696,325 | 357,353,458 | 88,486,511 | 362,839,798 | 318,695,105 | 354,025,698 | 74,143,644 |
| | | ------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- |
| | | 425,178,000 | 440,897,941 | 426,095,167 | 146,864,364 | 409,557,943 | 393,686,311 | 419,737,646 | 143,186,696 |
| | | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාල විශ්ලේෂණ වාර්තාව අනුව වර්ෂ 10 ට වැඩි හිඟ හිටි වරිපනම් රු.3,604,247 ක් ද, වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් අතර රු.7,711,011 ක් ද, වර්ෂ 3 ක සිට වර්ෂ 5 ක් අතර රු.5,006,314 ක් ද, වර්ෂ 1 ක සිට වර්ෂ 3 ක් අතර රු.5,590,587 ක් ද, වර්ෂ 1 ට අඩු රු.4,812,789 ක් ද වී තිබුණද, හිඟ අයකරගෙන නොතිබුණි. | ජංගම සේවා පැවැත්වීම්, රතු නිවේදන බෙදීම්, දේපල තහනම් කිරීම් ආදී වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව. | හිඟහිටි වරිපනම් හා බදු අයකර ගත යුතුය. |
| (ආ)(i) | කාල විශ්ලේෂණ වාර්තාව අනුව වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් අතර හිඟ කඩ කුලී රු.705,370 ක් ද, වර්ෂ 3 ක සිට වර්ෂ 5 ක් අතර රු.5,842,830 ක් ද, වර්ෂ 1 ක සිට වර්ෂඉ3 ක් අතර රු.22,539,055 ක් ද, වර්ෂ 1 ට අඩු රු.2,029,844 ක් ද වී තිබුණද, හිඟ කඩ කුලී අයකරගෙන නොතිබුණි. | අයකිරීමට එරෙහි නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතින බව. | හිඟහිටි කඩ කුලී අයකළ යුතුය. |
| (ii) | කඩ කාමර 23 කට අදාලව වසර 10 කට වැඩි කාලයක සිට පැවති රු.3,227,280 ක් වූ හිඟ පෙර මුදල් ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගෙන නොතිබුණි. | පෙර මුදල් අය නොකර කඩ කාමර ලබාදී ඇති අතර විධිමත් ගිවිසුම් නොමැති බව. | හිඟහිටි පෙර මුදල් අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහජන පැමිණිලි 1,120 කින් 439 ක් විසඳමින් පැවතිණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, පෞද්ගලික ආරවුල් සහ පැමිණිලි ආදිය මත විසඳීමට නොහැකිවී ඇති බව. | මහජන පැමිණිලි විසඳිය යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අති විශේෂ ගැසට්පත්‍රය අනුව සභාවට අයත් ආදාහනාගාර දෙක සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | බලපත්‍ර ලබාගැනීමට අවශ්‍ය ලියවිලි යවා ඇති බව. | ගැසට්පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට, පරිසර බලපත්‍ර අලුත් කර නොගත් ව්‍යාපාර හා කර්මාන්ත සංඛ්‍යාව 11 ක් ද, නව පරිසර බලපත්‍ර ලබා නොගත් සංඛ්‍යාව 26 ක් ද වී තිබුණි. | නීති මගින් කටයුතු කරනු ලබන බව. | නීතිමය කටයුතු කළයුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ මිය ගිය, සේවය අතහැර ගිය නිලධාරීන් 9 දෙනෙකුගේ අයවීම් හිඟ හිටි සේවක ණය ශේෂය රු.745,149 ක් අයකර ගෙන නොතිබුණි. | මරණ පාරිතෝෂිකයෙන් හිඟ නිරවුල් කරනු ලබන බව හා සේවය අතහැර ගිය සේවකයින්ගේ තොරතුරු නොමැති බව. | හිඟ සේවක ණය ශේෂ අයකර ගත යුතුය. |